# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## නොතාරිස් (සංශෝධන)

**(107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2023 දෙසැම්බර් මස 07 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 නොවැම්බර් මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[221 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශනය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥා පනතේ 28 වන වගන්තියේ (1අ) උපවගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු වූ මුදලක් තමා විසින් ගෙවන ලද බවට බලපත්‍රය අලුත් කිරීම සඳහා වූ දිවුරුම් ප්‍රකාශයේ සඳහනක් කිරීමේ වගකීම නොතාරිස්වරයා වෙත පැවරීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තියේ විෂය පථය තව දුරටත් පුළුල් කිරීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 38අ වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර එම අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ ගනුදෙනුවක සැබෑ නෛතික ස්වභාවය නිශ්චය කරගනු ලැබිය යුතු බවටත් එය ඔප්පුවක් ලියා අත්සන් කරන්නන්ට තේරුම් කර දිය යුතු බවටත් නොතාරිස්වරයාට නියම කිරීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ නොතාරිස්වරු විසින් ඔප්පු ලේඛනය ඉදිරිපත් කිරීමට අදාළ නව ආකෘතියක් හඳුන්වා දීම වේ.

## නොතාරිස් (සංශෝධන)

එල්.ඩී.—ඕ. 7/2023

### (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2023 අංක        දරන නොතාරිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

107 වන අධිකාරයේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතේ 28 වන වගන්තියේ (1අ) උපවගන්තියේ "යවා ඇති බවට දිව්රුම් ප්‍රකාශයක් එම ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතු ය." යන වචන වෙනුවට, "යවා ඇති බවට සහ 35 වන වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් යම් මුදලක් පනවා ඇත්තේ නම්, එකී මුදල ගෙවා ඇති බවට ද වූ දිව්රුම් ප්‍රකාශයක් එම ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (5) වන රීතිය වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"ඔප්පු, වෙන් නොකළ තනි කොළයක හෝ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරන ලද කොළවල ලිවිය යුතු බව

5. කල්පවතින පාච්මන්ට් හෝ නිල් කඩදාසියක සම්පූර්ණ තනි කොළවල හෝ බෙදා වෙන් නොකළා වූ කඩදාසි එකකට වඩා වැඩි ප්‍රමාණයක ලියා ඇති යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක්, ඔහු විසින් -

(අ) භාවිත කරන සෑම එක් එක් කොළයක් ම හෝ කඩදාසියක් ම, එකී නොතාරිස්වරයා පදිංචිව සිටින දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත

කලින් ඉදිරිපත් කර, එකී කඩදාසි වෙනත් යම් කාර්යයක් සඳහා භාවිත කිරීම වැළැක්වීමේ අරමුණින් යුතුව එකී රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී කඩදාසි සලකුණු කර හෝ අත්සන් කර හෝ පිටසන් කර ඇත්නම් මිස; හෝ

(ආ) එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන පාර්ශ්ව සහ නොතාරිස්වරයා විසින් ඔප්පුව හෝ සාධන පත්‍රය ලියන ලද සෑම කඩදාසියක්ම හෝ කඩදාසි කොටසකම අත්සන් කර ඇත්නම් මිස; සහ

(ඇ) පිටු අංකනය කර ඇත්නම් මිස,

සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම කරනු නොලැබිය යුතු ය";

(2) එහි (7අ) රීතියෙහි -

(අ) (අ) ඡේදයෙහි "පැවරුමක්, තෑග්ගක් හෝ හුවමාරුවක් සම්බන්ධයෙන් වන සියලු ඔප්පු හෝ සාධන පත්‍ර" යන වචන වෙනුවට, "සියලු ඔප්පු හෝ සාධන පත්‍ර" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) එකී ගෙවීම සනාථ කරන මුද්දර හෝ අදාළ බැංකුවෙන් ලද කුවිතාන්සියේ මුල් පිටපත නොතාරිස්වරයා විසින් ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ අනුපිටපතට ඇමිණිය යුතු ය.";

(ඇ) (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඈ) ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ අනුපිටපතට මුද්දර යොදා ඇති අවස්ථාවක දී, ලියාපදිංචිය සඳහා මුල් පිටපත ඉදිරිපත් කරනු ලබන විට මුද්දර අලවන ලද එකී අනුපිටපතේ සත්‍ය පිටපතක් මුල් පිටපතට අමුණනු ලැබිය යුතු ය."; සහ

(ඈ) පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"ඔප්පු හෝ සාධන පත්‍ර සඳහා මුද්දර යෙදීම";

(3) එහි (9) වන රීතියේ "දෙවන අවස්ථාවේ දී ඔහු විසින්" යන වචන වෙනුවට "ඔහු විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි (10) වන රීතිය ඉවත් කිරීමෙන්;

(5) එහි (15අ) රීතියේ -

(අ) (ආ) ඡේදයේ "බලයලත් තැනැත්තකුගේ," යන වචන වෙනුවට "සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ බලයලත් තැනැත්තකුගේ," යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්;

(6) එහි 17 වන රීතියේ -

(අ) (ආ) ඡේදයේ (iii) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

“(iii) පැවරුම් ඔප්පුවක් හෝ තෑගි ඔප්පුවක් හෝ හුවමාරු ඔප්පුවක් හෝ අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් වන විට දී ඔහු විසින් එම සාධන පත්‍රයේ නොතාරිස්ගේ පිටපතට, නොතාරිස්වරයා විසින් ස්වකීය මුද්‍රාව තබා ඇති, සාක්ෂිකරුවන් හැර අත්සන්කරුවන්ගේ, විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ ඡායාරූප අලවනු ලැබිය යුතු අතර ඔහු විසින් එම අත්සන්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත්‍රයේ, විදේශ ගමන් බලපත්‍රයේ හෝ රියදුරු බලපත්‍රයේ පිටපත්, නොතාරිස්ගේ පිටපතට අමුණා තබනු ලැබිය යුතු ය.”;

(ආ) එම රීතියේ (ඇ) ඡේදයේ “සම්පූර්ණ නම” යන වචන වෙනුවට “ මුලකුරු සමග නම” යන වචන ආදේශ කිරීමෙන්;

(7) එහි (20) වන රීතියේ (උ) ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

“(උ) විශේෂයෙන් ම, එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ සිදු කර ඇති මකා දැමීම්, වෙනස් කිරීම් සහ අන්තර් නිවේශන පිළිබඳව සහ එකී මකා දැමීම් වෙනස් කිරීම් සහ අන්තර් නිවේශන සිදු කරනු ලැබුවේ එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ඉහත කී පරිදි කියවා දීමට පෙරාතුව ද යන වග සහ මකා දැමීම්, වෙනස් කිරීම් හෝ අන්තර් නිවේශන තිබේ නම් ඒවා කර ඇත්තේ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ අත්සන්වලටද, යොමු අංකවලටද සහ ඒවාට අලවා ඇති මුද්දර මත ලියන ලද්දකට යන වග දක්වනු ලැබිය යුතු ය; සහ”;

(8) එහි (26) වන රීතියේ (අ) ඡේදයේ (i) අනුඡේදයේ "“ඊ ආකෘතියේ” යන වචන වෙනුවට “ඊ1 ආකෘතියේ” යන වචන සහ අංක ආදේශ කිරීමෙන්; සහ

(9) එහි (30) වන රීතියේ "ඔහු විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලබාගත් ඇටෝර්නි බලපත්‍රයේ සහතික

කරන ලද පිටපතක් මුල් පිටපතට ද එහි සත්‍ය පිටපත් එහි අනුපිටපතට සහ නොතාරිස්ගේ පිටපතට ද අමුණනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ඔහු විසින්, මුල්පිටපතට, අනුපිටපතට සහ එහි නොතාරිස්ගේ පිටපතට ලියාපදිංචි ඇටෝර්නි බලපත්‍රයේ සත්‍ය පිටපතක් අමුණනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 38අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 38අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"නොතාරිස්වරයා විසින් ගනුදෙනුවේ සැබෑ ස්වභාවය පැහැදිලි කර දෙනු ලැබිය යුතු බව

38අ. (1) (අ) පාර්ශවකරුවන් අතර ගනුදෙනුවේ සැබෑ නෛතික ස්වභාවය නිශ්චය කරගැනීමට ප්‍රයත්න දැරීම සහ සැබෑ ගනුදෙනුව සඳහා ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කිරීම; සහ

(ආ) සෑම ඔප්පුවකම හෝ සාධන පත්‍රයක ම සැබෑ ස්වභාවය එකී ඔප්පුවට හෝ සාධන පත්‍රයට යම් ලියා අත්සන් කරන්නකු විසින් අත්සන් තැබීමට පෙර එකී ලියා අත්සන් කරන්නාට විශේෂයෙන්ම හා ප්‍රකාශිතව පැහැදිලි කිරීම,

සෑම නොතාරිස්වරයකුගේම වගකීම වන්නේ ය

(2) ගනුදෙනුව සත්‍ය වශයෙන් ම උකස්කරයක්, කොන්දේසි සහිත පැවරීමක් හෝ ඒ හා සමාන වෙනත් යම් සාධන පත්‍රයක් හෝ ඔප්පුවක් සම්බන්ධයෙන් වන්නේ නම්, ඔහු විසින්, ඍජුව හෝ වක්‍රව, යම් පැවරුම් ඔප්පුවක් සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම නොකළ යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තියේ සඳහන් යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක්

ලියා අත්සන් කරනු ලබන සෑම නොතාරිස්වරයකු ම වරදකට වරදකරු වන අතර, රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩ මුදලකට යටත් වන්නේ ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම**

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි ඊ ආකෘතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

[31(24) වගන්තිය]

"ඊ. ආකෘතිය

ඔප්පු රෙජිස්ටරය

| අංකය | සහතික කළ දිනය | සාධන පත්‍රයේ ස්වභාවය | පාර්ශවකරුවන් | | ලියාපදිංචි කරන දිස්ත්‍රික්කය | ඔප්පුව අදාළ වන ඉඩම, එක් ඉඩමකට වඩා අදාළ වේ නම් පළමු ඉඩම | ප්‍රතිෂ්ඨාව | දෙවැනි පිටපතට මුද්දර |
|---|---|---|---|---|---|---|---|---|
| | | | දීමනාකරු | ලැබුම්කරු | | | | |
| | | | | | | | | |

(2) එහි "ඊ" ආකෘතියට ඉක්බිතව ම, පහත අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන් :-

[31(26) වගන්තිය]

"ඊ1" ආකෘතිය

ඔප්පුවල මාසික වාර්තාව

වර්ෂ　　　මස තුළ සහතික කරන ලද ඔප්පුවල ලැයිස්තුව

නොතාරිස්ගේ නම :

නොතාරිස්ගේ ජා. හැ. අ. :

අංකය :

| අංකය | ඔප්පු අංකය | සහතික කළ දිනය | සාධන පත්‍රයේ නම | දීමනාකරු | | ලැබුම්කරු | | ලියාපදිංචි කළ දිස්ත්‍රික්කය | ඉඩම පිහිටි ප්‍රා. ලේ. කොට්ඨාශය | ඉඩමේ නම | ඉඩම පිහිටි පළාත් පාලන ආයතනයේ නම | ප්‍රතිෂ්ඨාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | නම හා ලිපිනය | ජා. හැ. අ | නම හා ලිපිනය | ජා. හැ. අ | | | | | |
| | | | | | | | | | | | | |

සැක දුරු කිරීම

6. සැක දුරු කිරීමේ කාර්ය සඳහා මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව නීත්‍යානුකූලව ලියා අත්සන් කරන ලද සහ (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි කිරීමට පොරොත්තුව පවත්නා යම් ඔප්පු හෝ සාධන පත්‍ර සඳහා මේ පනතේ විධිවිධාන බලනොපාන බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී